8 පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ වෙළෙඳාම ප්‍රවාහනය හා සන්නිවේදනය

## මානුෂ අන්තර් ක්‍රියාකාරිත්වයේ මාධ්‍ය ලෙස වෙළෙඳාම


ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත රටක් ව පැවතුණ බව අතීත වංශකථා තොරතුරු ගෙන හැර දක්වයි. ලක් දෙරණේ නිෂ්පාදන අතිරික්තය, ගම් හා නගර අතර හුවමාරු වූයේ භාණ්ඩවලට භාණ්ඩ ලෙසිනි. වළං සපයා සහල් ද ගොවි උපකරණ සපයා සහල් ද ලබා ගැනීම ඊට නිදසුනකි.

කෙසේ වුව ද ජන සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ අවශ්‍යතා සංකීර්ණ වී ඉල්ලුම වැඩි වී නිෂ්පාදනය වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ, ප්‍රවාහන හා සන්නිවේදන ක්‍රමවල අවශ්‍යතාව හා දියුණුව ඇති විය. රට තුළ විවිධ ජාතීන් අතර හා ප්‍රාදේශීය වශයෙන් අන්‍යොන්‍ය සම්බන්ධතා ගොඩනගා ගැනීමට වෙළෙඳාම, ප්‍රවාහනය හා සන්නිවේදනය බෙහෙවින් ම බලපා ඇත.

වර්තමානයේ වෙළෙඳාම හා ප්‍රවාහනය සිදු කිරීමට මැදිහත් සාධකය වන්නේ සන්නිවේදනය යි කීම වරදක් නොවේ. අන්‍යොන්‍ය වශයෙන් මිනිස් අවශ්‍යතා හැසිරවීමෙන් වෙළෙඳ හා ප්‍රවාහන පහසුකම් සැලසීමට ප්‍රබල ම කාරකයක් ලෙස සන්නිවේදනය (ප්‍රචාරණය) ක්‍රියාත්මක වේ.


## 8.1 ශ්‍රී ලංකාවේ වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳාම රට තුළ (අභ්‍යන්තර) හා රටින් බැහැර (විදේශ) වෙළෙඳාම යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම කෙරෙහි බලපාන සාධක කීපයක් පහත දැක්වෙන සටහනෙහි දැක්වේ.




8.1 රූපය : අභ්‍යන්තර වෙළෙඳාම කෙරෙහි බලපාන සාධක

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම කෙරෙහි බලපා ඇති සාධක කීපයක් පහත දැක්වෙන සටහන මඟින් ඉදිරිපත් කර ඇත. එහි දැක්වෙන කරුණුවලට අමතර ව කාලීන ව බලපෑම් කරන සාධක ද ඇත.




8.2 රූපය : ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම කෙරෙහි බලපාන සාධක

ශ්‍රී ලංකාව මුල් යුගයේ බොහෝ දුරට ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවති රටක් බවට තොරතුරු අනාවරණය වේ. භූගෝලීය වෙනස්කම් අනුව අවශ්‍යතා විවිධ වුව ද අතීතයේ රට තුළ සිදු වූ ගනුදෙනු ඒවා සපුරා ගැනීමට ප්‍රමාණවත් විය. ශ්‍රී ලංකාව යටත් විජිතයක් ව පැවති යුගයේ ආනයන අපනයන වෙළෙඳමේ ඇති වූ දියුණුවත් සමඟ අභ්‍යන්තර හා විදේශීය වෙළෙඳමේ විශාල පරිවර්තනයක් සිදු විය. වෙළෙඳ ක්ෂේත්‍රය තුළ සිදු වූ වෙනස පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් හඳුනා ගත හැකි ය.

## ශ්‍රී ලංකාවේ වෙළෙඳ කටයුතුවල ප්‍රවර්ධනය

| එදා | අද |
|---|---|
| • යැපීමට පමණක් භාණ්ඩ නිපදවනු ලැබී ය. | • අතිරික්ත භාණ්ඩ තොග වෙළෙඳපොළ ඉලක්ක කර නිපදවයි. |
| • වෙළෙඳ ගනුදෙනු සීමිත විය. | • වෙළෙඳ ගනුදෙනු සංකීර්ණ වී ඇත. |
| • අවශ්‍යතා ප්‍රාදේශීය ව සපුරා ගනු ලැබී ය. | • අවශ්‍යතා සපුරා ගැනීමට විවිධ රටවල සහාය පතයි. |
| • භූගෝලීය වෙනස්කම් පදනම් කර ගෙන වෙළෙඳපොළ භාණ්ඩ අවශ්‍යතා සපුරා ගැනිමේ ගැටලු මතු විය. | • ප්‍රවාහනය සහ සන්නිවේදනයෙන් එම ගැටලු ජය ගෙන ඇත. |
| • අන්තර් යැපීම් කෙරෙහි විශ්වාසයක් නොවී ය. | • අන්තර්ජාතික යැපීම් මත දැඩි ලෙස විශ්වාසයෙන් කටයුතු කරයි. |
| • වෙළෙඳපොළ සකස් වූයේ අවශ්‍යතා මත ය. | • වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය මත සකස් වී ඇත. |
| • පාරිභෝගික අවශ්‍යතාවට සරිලන භාණ්ඩ සොයා වැඩි දුරක් යාම සඳහා කාලය නාස්ති කිරීමට සිදු විය. | • නව අවශ්‍යතා ඇති කරමින් භාණ්ඩ පාරිභෝගිකයා සොයා එයි. |
| • භාණ්ඩ සොයා පාරිභෝගිකයා නගරයට සේන්දු විය. | • පාරිභෝගිකයා අල්ලා ගැනීමට, මාර්ග දෙපස ජනාකීර්ණ ස්ථානවල භාණ්ඩ ඒකරාශී වී බලා සිටී. (සුපර්මාර්කට්) |

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවට ආනයනය කරන භාණ්ඩ පහක් හා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන භාණ්ඩ පහක් නම් කරන්න.
2. එම භාණ්ඩ ආනයනය කරන රටවල් හා අපනයනය කරන රටවල් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
3. ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා බැඳුණු අන්තර් ජාතික වරායන් 10ක් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

## ශ්‍රී ලංකාවේ වෙළෙඳාම ආශ්‍රිත ගැටලු

දේශීය හා විදේශීය වෙළෙඳ ගනුදෙනු පවත්වා ගෙන යාමේ දී ලොව බොහෝ රටවලට මුහුණ දීමට සිදු වන ගැටලු සමහරක් ශ්‍රී ලංකාවට ද පොදු ය. එවැනි ගැටලු කීපයක් පහත දැක්වේ.

- මිල උච්චාවචනය
- භාණ්ඩ සඳහා පවතින තරගය
- අපනයන භාණ්ඩ සඳහා සාධාරණ මිලක් නො ලැබීම
- අපනයනවලට ආදේශන භාණ්ඩවලින් ඇති වන තරගය
- ජගත් හා කලාපීය වෙළෙඳ සංවිධාන දේශීය වෙළෙඳපොළට කරන බලපෑම
- බහුජාතික සමාගම්වල ඒකාධිකාරී බලයට නතු වීම
- ආර්ථික ශක්තියේ දුබලතා (විදේශ විනිමය හිඟය)

**ක්‍රියාකාරකම**

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් මෑත කාලයේ දී මතු වී ඇති ගැටලු දෙකක් විස්තර කරන්න.

## 8.2 ශ්‍රී ලංකාවේ ප්‍රවාහනය

ශ්‍රී ලංකාවේ පැරණි ප්‍රවාහන මාර්ග වනදුර්ග, ජලදුර්ග, ගිරිදුර්ග හරහා ද සමහර අවස්ථාවල දී තොටුපළවල් ඔස්සේ ද විහිදී ගිය බවට ඓතිහාසික මූලාශ්‍රවලින් තොරතුරු හෙළි වේ. එකල ජන සංඛ්‍යාව සීමිත වීමත් අවශ්‍යතා සංකීර්ණ නො වීමත් නිසා පරිවහන පහසුකම් ද එතරම් දියුණු මට්ටමක නො වී ය.

බටහිර යුරෝපා ජාතීන්ගේ පැමිණීමෙන් පසු ව ශ්‍රී ලංකාවේ ප්‍රවාහන රටාවේ වෙනස්කම් රැසක් ම සිදු විය. පෘතුගීසි සමයේ මහා මාර්ග පද්ධතියේ සැලකිය යුතු තරම් වෙනසක් සිදු නොවුව ද ලන්දේසි යුගයේ දී ඔවුන්ගේ මව් රටෙහි පැවති පරිවහන රටා මෙරටට ද හඳුන්වා දීම සිදු විය. ඒ අනුව රට තුළ ඇළ මාර්ග තනනු ලැබී ය. එම ඇළ මාර්ග ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලට පමණක් සීමා විය.

පෘතුගීසි හා ලන්දේසීන්ට වඩා බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතියේ වෙනස්කම් රැසක් ම සිදු කරනු ලැබී ය. ශ්‍රී ලංකාවේ පාලන බලය ඉංග්‍රීසීන් සතු වීමෙන් පසුව වතු වගාව ව්‍යාප්ත කිරීම නිසා වතු කෘෂිකාර්මික නිෂ්පාදන කොළඹ වරායට ප්‍රවාහනය කිරීම සඳහා මහා මාර්ග හා දුම්රිය මාර්ග පද්ධතිය දියුණු කරන ලදී.

ඉංග්‍රීසීන් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට සරිලන අයුරින් ඉදි කරන ලද මෙම මාර්ග ජාලය සුළු වෙනස්කම් හා නවීකරණ කටයුතු කරමින් අදත් අපි ප්‍රයෝජනයට ගන්නෙමු.

### ශ්‍රී ලංකාවේ ප්‍රවාහන රටා

මතුරට මහා විද්‍යාලයේ භූගෝල විද්‍යාව විෂය භාර චන්ද්‍රකාන්ති ගුරුතුමියට විදුහල්පති තුමාගෙන් ලැබුණු පණිවිඩයක් අනුව පන්ති කාමරයෙන් බැහැරට යාමට සිදු විය. එහෙත් ගුරුතුමිය පන්තියෙන් බැහැරට ගියේ සැලසුම් කළ කාර්යය පත්‍රිකාවක් හුණු පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් පසුව ය. එම කාර්යය පත්‍රිකාව පහත දැක් වේ.

**කාර්ය පත්‍රිකාව :**


- ප්‍රවාහනය යනු කුමක් ද ?
- ප්‍රවාහන සේවයක් අවශ්‍ය වන්නේ ඇයි ?
- ප්‍රවාහන රටා රූ සටහනකින් ඉදිරිපත් කරන්න.

කාර්යය පත්‍රිකාව අනුව කටයුතු කළ සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත ව සිටින විට භූගෝල විද්‍යා විෂය උපදේශක මහතා පන්තියට ඇතුළු විය. ගුරුතුමිය බැහැර ගිය බව දැනගත් එතුමා සිසුන්ට උදව් කිරීමට ඉදිරිපත් විය. පහත දැක්වෙන්නේ එම සිසුන්ගේ කාර්ය පත්‍රිකාවේ නිමැවුම යි.

1. ප්‍රවාහනය යනු :
   "භාණ්ඩ හා මගීන් තැනක සිට තවත් තැනකට ගෙන යාම යි"
2. ප්‍රවාහන සේවයක් අවශ්‍ය වන්නේ ඇයි ?

- මිනිස් අවශ්‍යතා සීමිත ප්‍රදේශයක් තුළ ඉටු කර ගත නො හැකි වීම නිසා.
  නිදසුන් : අධ්‍යාපනය, ආරක්ෂාව, ආහාර සපයා ගැනීම
- සම්පත්වල විසංතුලනය නිසා ආනයනය කිරීමට සිදු වීම
  නිදසුන් : ගල් අඟුරු, ඛනිජ තෙල් වැනි ඉන්ධන
- තම ආර්ථික කටයුතු ඉටු කර ගැනීමට පදිංචි ස්ථානයෙන් බැහැරට යාමට සිදු වීම. (නිෂ්පාදන භාණ්ඩ අලෙවියට, රැකියා ස්ථානයට)
- කුතුහලය නිසා විවිධත්වයක් ලැබීමට, (ගවේෂණ කටයුතු සඳහා, සංචාරක කටයුතු සඳහා)
- නිෂ්පාදන කම්හල්වලට අමුද්‍රව්‍ය රැස් කිරීමට හා නිමි ද්‍රව්‍ය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට
- ගොවිපළ නිෂ්පාදන වෙළෙඳපොළට ගෙන යාම.

පහත දැක්වෙන රූ සටහනින් මතුරට මහා විද්‍යාලයේ සිසුන් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන රටා ඉදිරිපත් කර තිබුණි.



කාලච්ඡේදය නිමා වීමට ආසන්න වෙද්දී විෂය භාර චන්ද්‍රකාන්ති ගුරු මහත්මිය නැවත පන්තියට ඇතුළු වූවා ය. එතුමියට ඇති වූයේ බලවත් සතුටකි. සිසුන්ට සහ ගුරු උපදේශක මහතාට ස්තුති කළ ගුරු මහත්මිය එම කාර්යය අගය කළා ය. කාලච්ඡේදය නිමා වීමට පෙර ගුරු උපදේශක තුමා සිසුන් ගවේෂණයකට යොමු කර පන්තියෙන් සමු ගත්තේ ය.

- ප්‍රධාන පාරවල්වල කිලෝමීටර් කණුවේ අගයට යටින් අක්ෂරයක් හා අගයක් සටහන් කරල තියෙන්නෙ ඇයි ?




දවසේ වැඩ කටයුතු නිමා වුවත් ප්‍රශ්නයට පිළිතුරක් සොයා ගැනීමට නො හැකි ව සිටි නිමාලිගේ හිත, රාත්‍රී පුවත් විකාශනයේ දී ඇසුණු එක් පුවතක් කෙරෙහි තදින් ඇදී ගියේ ය.

අද සිට"A9" මාර්ගය පොදු ජනතාව වෙනුවෙන් දවසේ පැය 24ම විවෘත කෙරේ.............

ඒ සැණින් ම නිමාලි තම මාමාට දුරකථන ඇමතුමක් දී එම පුවත පිළිබඳ ව විස්තර විමසුවා ය.

නිමාලි : හලෝ....හලෝ.........සුබ රාත්‍රියක්, මම නිමාලි, කොල්ලුපිටිය පොලිසිය ද මේ ?

පොලිසියෙන් : ඔව්, කවුද නිමාලි කියන්නේ ?

නිමාලි : සාජන් ධර්මසිරි මගේ මාමා, නිමාලි දුව කතා කරනවා කියන්න.

පොලිසියෙන් : ආ නිමාලි දූ, සාජන් ධර්මසිරි අද පෙරහැර ඩියුටි, පණිවිඩයක් තියෙනවනම් කියන්න. මම එස්. අයි. පෙරේරා

නිමාලි : අනේ අංකල් A9 පාර කියන්නේ මොකක් ද? ඇයි ඒ පාරට මේ අංක, අක්ෂර දීල තියෙන්නේ?

එස්.අයි.පෙරේරා: ආ ඕකට ද මාමා හෙව්වේ, දුව ශ්‍රී ලංකාවේ සෑම ප්‍රධාන මාර්ගයකට ම මේ වගේ හඳුනා ගැනීමේ අක්ෂරයක් හා අංකයක් දීලා තියෙනවා. A අක්ෂරයෙන් මාර්ගයේ ගුණාත්මක බව, පළල, කාපට් කරල ද යන තොරතුරු දැනුවත් වෙනවා.
හරියට සාජන්ට් ධර්මසිරිගෙ ලේලිට නිමාලි කියල නමක් දීල තියෙන්නේ .............ඒ වගේ තමයි.

නිමාලි : හරි, හරි අංකල් එතකොට අංක ?

එස්.අයි.පෙරේරා: ඉතින් එක වගේ පාරවල් කීපයක් තිබෙන නිසා අංකත් දීල තියෙනවා. A,B,C,D අක්ෂරවලින් ශ්‍රේණි දීල තියෙනවා. ඒකෙන් අයිතියත් තහවුරු වෙනවා.

නිමාලි : ඒ කිව්වේ............................?

එස්.අයි.පෙරේරා: දැන් මට ටෙලිෆෝන් එකෙන්......... පාඩමක් උගන්වන්න වෙනව වගේ.


නිමාලි : අනේ අංකල්........

එස්.අයි.පෙරේරා: A,B කාණ්ඩ අයිතිය හා නඩත්තුව මාර්ග සංවර්ධන අධිකාරියට C,D කාණ්ඩවල මාර්ග පළාත් සභාවලට, සෙසු පාරවල් ප්‍රාදේශීය සභාවලට, වතු සමාගම්වලට, මහවැලි ප්‍රදේශයේ නම් මහවැලි සංවර්ධන අධිකාරියට, සමහර පාරවල් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට. වන ජීවී දෙපාර්තමේන්තුව මඟිනුත්, පෞද්ගලික ආයතන මඟිනුත් නඩත්තු වන පාරවල් තියෙනවා. දූලගේ සිතියම් පොත්වලත් මේ පිළිබඳ විස්තර ඇති නේ......

නිමාලි : හොඳයි හොඳයි අංකල් බොහොම ස්තුතියි, සුභ රාත්‍රියක්.

එස්.අයි.පෙරේරා: සුභ රාත්‍රියක්.

නිමාලිගේ සතුට උතුරා යන තරම්, ඇය ඉක්මනින් ම ජාතික සිතියම් සංග්‍රහය පෙරළා බැලී ය. පිටු අංක 82-83 සිතියම ලංකාවේ මහා මාර්ග සිතියම විය. නිමාලිට ලැජ්ජාවක් දැනුණ ද පසු දින පන්තියට ගියේ ජයග්‍රාහී ලීලාවෙනි.




8.1 සිතියම : ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතිය

මූලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය

## මහා මාර්ග මඟින් ප්‍රවාහනය

ශ්‍රී ලංකාවේ ගම්, නගර, දිස්ත්‍රික්ක හා පළාත් සම්බන්ධ කරන ප්‍රවාහන ජාලය මහා මාර්ග ප්‍රවාහනය යි. දුම්රිය, නාවික හා ගුවන් තොටුපළ අතර ඒකාබද්ධ සේවාවක් පවත්වා ගැනීමට ද මහා මාර්ග උදව් වේ. මහා මාර්ගවල ගුණාත්මක බව අනුව ශ්‍රී ලංකාවේ මහා මාර්ග වර්ගීකරණයක් පහත වගුවේ දැක්වේ. මේ අනුව සෑම මහා මාර්ගයක් ම හඳුනා ගැනීමේ නිර්ණායක ඇති බව අනාවරණය වේ.

8.1 වගුව
ශ්‍රී ලංකාවේ මාර්ග වර්ගීකරණය

| මහා මාර්ගයට හිමි ශ්‍රේණිය | නම හා තත්ත්වය | සබඳතාව | දිග (km) | ධාවන පථය පළල (m) |
|---|---|---|---|---|
| A | මොවු මාර්ග ගල්, තාර සහිත කාපට් පාර, මං තීරු ඇත. | අගනුවර හා පළාත්, නගර | 4,219 | 8-12 |
| B | ගල් හා තාර සහිත කාපට් කළ හෝ නොකළ | ප්‍රධාන නගර හා මොවු මාර්ග යා කිරීම | 7,674 | 4-6 |
| C | ගල්, තාර පාර | ප්‍රධාන මාර්ග යා කරයි. | 10,949 | 4 |
| D | බොරළු පාර, තාර | ගම් හරහා ප්‍රධාන මාර්ග | 6,121 | තනි වාහනයකට යා හැකි ය. |
| E | බොරළු, මැටි පාර | ගම් හරහා වැටී ඇත. | * | |

* ගණනය කර නැත.

මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත, 2010, ශ්‍රී ලංකා මහ බැංකුව


**විශේෂ අවධානයට**

- ශ්‍රී ලංකාවේ ක්‍රමානුකූල ව මහා මාර්ග නිර්මාණය 1820දී බ්‍රිතාන්‍ය ජාතිකයන් ආරම්භ කළේ කොළඹ-මහනුවර දක්වා ය.
- 1821දී ගලගෙදර දුර්ගය ඔස්සේ කුරුණෑගල දක්වා එම මාර්ගය දීර්ඝ කරන ලදි.
- කොළඹ-කටුනායක, කොළඹ-මාතර අධිවේගී මාර්ග ඉදි වෙමින් පවතී.

### ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටලු

යටත් විජිත යුගයේ දී ශ්‍රී ලංකාවේ ඇති කරන ලද දුම්රිය හා මහා මාර්ග ජාලයට


නව මාර්ග හා විවිධ ප්‍රතිසංස්කරණ එක් කරමින් තවමත් ප්‍රයෝජනයට ගැනේ. කාලීන අවශ්‍යතාවලට අනුකූල ව මාර්ග සකස් නො වීම නිසා ගැටලු ගණනාවකට ම ප්‍රවාහන ක්ෂේත්‍රය මුහුණ පා ඇත. පහත දැක්වෙන සටහනෙන් එම ගැටලු කීපයක් දක්වා ඇත.




8.3 රූපය : ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටලු

## ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා

ඉහත රූපයේ දැක්වෙන ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින ගැටලු මග හරවා ගැනීමට ශ්‍රී ලංකා රජය විවිධ කාලවල දී විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇත. දෙස්, විදෙස් ආධාර ඇති ව ක්‍රියාත්මක කළ හා දැනටත් ක්‍රියාත්මක වන සංවර්ධන සැලසුම්වල නූතන ප්‍රවණතාවන් 8.4 රූපයෙන් දක් වේ.




8.4 රූපය : ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා

**ක්‍රියාකාරකම :**

ශ්‍රී ලංකාවේ සිතියම් හා කාලීන තොරතුරු අධ්‍යයනය කර වර්ෂා කාලවල දී


- ගංවතුරෙන් යට වන
- නාය යාම්වලට ලක් වන
- ගිලා බැසීම්වලට ලක් වන

මාර්ග හා අදාළ දිස්ත්‍රික්ක ඇතුළත් ලැයිස්තුවක් සකස් කරන්න.

## දුම්රිය ප්‍රවාහනය

දුම්රිය ප්‍රයෝජනයට ගෙන භාණ්ඩ හා මගී ප්‍රවාහනය, මෝටර් රථ මගින් කෙරෙන ප්‍රවාහනයට වඩා ලාබදායී ප්‍රවාහන සේවයකි. යටත් විජිතවාදීන්ගේ දායකත්වයෙන් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට ඉදි කරන ලද මෙම දුම්රිය ප්‍රවාහන සේවය වර්තමානයේ භාණ්ඩාගාර ණය මුදල්වලින් යැපෙන සේවාවක් බවට පත් ව ඇත.

කොළඹ කේන්ද්‍රගත වන සේ විවිධ දිශාවන්ට දිව යන දුම්රිය මාර්ග පද්ධතියේ වර්තමාන මෙහෙයුම් මධ්‍යස්ථානය වන්නේ ද කොළඹ කොටුව යි. 1877දී කොළඹමහනුවර දුම්රිය මාර්ගයෙන් ආරම්භ වූ දුම්රිය ප්‍රවාහන පද්ධතිය 1463km ක් පමණ දිගකින් යුතු ය. දුම්රිය ප්‍රවාහනයේ වැදගත්කම පහත දැක්වෙන කරුණුවලින් අනාවරණය වේ.




8.2 සිතියම : ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග

- රාජ්‍ය අංශයේ භාණ්ඩ හා මගී ප්‍රවාහනයේ ප්‍රධාන ම මාධ්‍යය යි. (ඛනිජ තෙල්, ආහාර ද්‍රව්‍ය, පොහොර වැනි භාණ්ඩ ප්‍රවාහනය හා කාර්යාල දුම්රිය සේවය)
- එදා පැවති අවිස්සාවේල්ල-ඕපනායක මාර්ග අද වන විට ඉවත් ව ඇත.
- කොළඹ-අවිස්සාවේල්ල පටු මාර්ගය පුළුල් මාර්ගයක් බවට පත් ව ඇත. (පටු මාර්ගයේ එලන ලද පීලි තව ම දක්නට තිබේ.)
- මාතර-කතරගම දක්වා නව මාර්ගයක් ඉදි කිරීමට යෝජිත ය. එහි මාතරදික්වැල්ල අතර වැඩ කටයුතු මේ වන විට අරඹා ඇත.
- 1993 දී අනුරාධපුර සිට මිහින්තලය දක්වා නව මාර්ගයක් ඉදි විය.
- "නගරාන්තර" කොළඹ-නුවර දුම්රිය සේවයක් ක්‍රියාත්මක වේ.
- දෙස් විදෙස් සංචාරකයන් සඳහා "හිතාවි" නමින් නැරඹුම් මැදිරි සහිත දුම්රිය සේවාවක් අරඹා ඇත.
- කටුනායක, බණ්ඩාරනායක ගුවන් තොටුපලේ සිට කොළඹ කොටුව දක්වා සංචාරකයන් සඳහා සුඛෝපභෝගී දුම්රිය සේවයක් ක්‍රියාත්මක වේ.
- පරිපාලනමය හා සේවක ප්‍රශ්න නිසා අකාර්යක්ෂම සේවයක් ලෙස මහජන අප්‍රසාදයට ලක්වෙමින් පවතී.

මූලාශ්‍රය-: එම්.ඩී ගුණසේන, 2003, නවීන ගුණසේන
පිලිප් ලෝක සිතියම් පොත ඇසුරෙන් සකස් කරන ලදි.

## ගුවන් ප්‍රවාහනය


### අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය

රට තුළ අභ්‍යන්තර පරිවහනය සඳහා වූ අභ්‍යන්තර ගුවන් තොටුපළවල් 11ක් පමණ විවිධ අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගැනේ. පොදු ජනතාව ලබා ගන්නා ප්‍රයෝජන අඩු ය. ප්‍රවාහන මිල අධික වීමත්, රට තුළ පවතින අනාරක්ෂිත තත්ත්වයත් ඊට බලපා ඇත. සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට හිතකර ය. සුනාමි, නාය යාම්, ගංවතුර වැනි ස්වාභාවික විපත් අවස්ථාවල දී හා රටේ ආරක්ෂාව සඳහා ඉටු කරන කාර්යභාරය ඉතා අගනේ ය. එවැනි අවස්ථාවල දී අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනයටත් විපතට පත් වූවන්ගේ දිවි ගලවා ගැනීමටත් දායක වේ.

### ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය

ශ්‍රී ලංකාව කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සම්බන්ධ කර ගනිමින් ලොව විවිධ රටවල් හා සම්බන්ධ වේ. ඉන්දියන් සාගරයේ දූපතක් ලෙස පිහිටීමේ වැදගත්කමත් පෙර අපර දෙදිග ගුවන් මාවතේ පිහිටීමේ වැදගත්කමත් නිසා ජාත්‍යන්තර ගුවන් සේවා ආකර්ශනය කර ගැනීමට හැකි ව ඇත. කටුනායක ගුවන් තොටුපළ දිවා, රාත්‍රි භේදයකින් තොර ව වර්ෂය පුරා ම ක්‍රියාකාරී ගුවන් තොටුපළකි.

ශ්‍රී ලන්කන් ගුවන් සේවය, ලොව ගුවන් තොටුපළ ගණනාවක් සම්බන්ධ කර ගත් ප්‍රවාහන ජාලයක් පවත්වා ගෙන යයි. කැනඩා රජයේ ආධාර ඇති ව 1961දී ගුවන් තොටුපළ සංවර්ධනය කිරීමෙන් පසු ගුවන් පරිවහන සේවයේ සහ ගමන් වාරවල දියුණුවක් ඇති විය. ජගත් ගුවන් සබඳතා තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් හා දක්ෂිණ ශ්‍රී ලංකාවේ සංවර්ධනය අරමුණු කර ගෙන දෙ වන ජාත්‍යන්තර ගුවන් තොටුපළ, මත්තල ඉදි වෙමින් පවතී.




8.3 සිතියම : ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ

> **ඔබේ දැනුමට**
> - ගුවන් ප්‍රවාහනයේ වාසි අවාසි.....
> - ගුවන් ප්‍රවාහනය රටේ සංවර්ධනයට දායක කර ගත හැකි ද?
> - ලෝක ගුවන් ප්‍රවාහන සේවා හමුවේ ශ්‍රී ලංකාවට තරග කළ හැකි ද? යන තේමා ඔස්සේ විවාදයක යෙදෙන්න.

මූලාශ්‍රය-:
එම්.ඩී ගුණසේන, 2003, නවීන ගුණසේන පිලිප් ලෝක සිතියම් පොත ඇසුරෙන් සකස් කරන ලදී.

## නාවික ගමනාගමනය

ජාත්‍යන්තර පරිවහන කටයුතු සඳහා කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වැනි වරායයන් ආශ්‍රිත ව පහසුකම් සලසා ඇත. මෙය ලාභදායි ප්‍රවාහන මාධ්‍යයකි. නැගෙනහිර බටහිර මුහුදු මාර්ග කේන්ද්‍රස්ථානයක ශ්‍රී ලංකාව පිහිටීම නිසා නාවික ප්‍රවාහන සේවය සුවිශේෂත්වයක් උසුල යි.


- ආනයන අපනයන,
- ප්‍රති අපනයන,
- සේවා පහසුකම් සැපයීම,
- අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ (වියළි තටාක සහිත)
- කඩිනම් හා කාර්යක්ෂම ලෙස බහාලුම් මෙහෙයවීම,

යන කරුණු නිසා ශ්‍රී ලංකාවේ නාවික ප්‍රවාහනය ජගත් කීර්තියට පත් වූ විදේශ ආදායම් උත්පාදනය කරන සේවාවක් බවට පත් ව ඇත.

ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කමත් අන්තර් ජාතික නාවික ගමන් මාර්ගය දකුණු මුහුදු සීමාව ඔස්සේ වැටී තිබීමත්, සේවා සැපයීම් තුළින් සංවර්ධන ඉලක්ක ජය ගත හැකි බව තේරුම් ගැනීමත් නිසා හම්බන්තොට ජාත්‍යන්තර වරායක් ඉදි කරන ලදි.

## ධීවර වරායන්

ශ්‍රී ලංකාව දූපතක් බැවින් දිවයින වටා 1770km ක් පමණ දිගු මුහුදු වෙරළ තීරයක් අප සතු වේ. ඊට අමතර ව ධීවර සම්පත් සහිත අනන්‍ය ආර්ථික කලාපයේ මුහුදු සම්පත් නෙළා ගැනීම සඳහා ඉදි කළ ධීවර වරායන් රාශියක් ද ශ්‍රී ලංකාව සතු ය. ගොඩබිම් මාර්ග අවහිරතා ඇති වූ හදිසි අවස්ථාවල දී නාවික ප්‍රවාහනය වඩා ප්‍රයෝජනවත් වේ. ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරේ දක්වා සහ කොළඹ සිට කන්කසන්තුරය දක්වා වරායකින් වරායකට මගී හා භාණ්ඩ ප්‍රවාහනය මීට නිදසුන් ය. උතුරේ ගැටුම් පැවති කාලවල මෙම ප්‍රවාහන සේවාව වඩාත් වැදගත් විය. බටහිර වෙරළ ආශ්‍රිත ධීවර වරායන් ප්‍රයෝජනයට ගන්නා ධීවරයින් වාරකන් කාලයේ දී නැගෙනහිර වෙරළට සංක්‍රමණය වී වෙරළ ආශ්‍රිත ධීවර කටයුතුවල නිරත වීම සාමාන්‍යයෙන් සිදු වේ. වෙරළේ පිහිටි සියලු වරායන් ආර්ථික කටයුතු සඳහා වැදගත් වේ.




8.4 සිතියම : ශ්‍රී ලංකාවේ වරායන්

මුලාශ්‍රය-: මිනින්දෝරු දෙපාර්තමේන්තුව, 1990, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය, පාසල් මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී.

**කොළඹ වරායේ වැදගත්කම........**

- පෙර අපර දෙදිග නාවික මාර්ගයේ නැවතුම් පොළකි.
- විශාලත්වය 2.6km$^2$ ක් පමණ වේ.
- ශ්‍රී ලංකාවේ මුහුදු භාණ්ඩ ප්‍රවාහනයෙන් 92%ක් පමණ මෙහෙයුම් කරයි.
- ඉන්දීය සයුරේ ප්‍රතිනැව්ගතකරණ වරායකි.
- මෝසම්, උදම්, ජල තරංගවලින් කරන බලපෑම්වලට දිය කඩන තුනකින් ආරක්ෂාව සලසයි.
- වර්ෂය පුරා දිවා රාත්‍රී භේදයකින් තොර ව සක්‍රිය ව පවතින වරායකි.
- ජාත්‍යන්තර සේවා පහසුකම් සලසයි. (වියළි තටාක සහිත)

මූලාශ්‍රයඃ මිනින්දෝරු දෙපාර්තමේන්තුව, 1990, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය, පාසල් මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී.


## ඇළ මාර්ග ආශ්‍රිත ප්‍රවාහනය

අභ්‍යන්තර ජල මාර්ග (ඇළ මාර්ග) විශාල මෙහෙයක් සිදු නො කළ ද ගංගා, ඔය, සහ කලපු සංවර්ධනය කර ගනිමින් ලන්දේසීන් විසින් ඉදි කළ ඇළ මාර්ගය අදත් විවිධ අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගැනේ. හැමිල්ටන් ඇළ කොළඹ-මීගමුව දක්වා විහිදේ. නමුත් දැනට ප්‍රයෝජනයට ගැනෙන්නේ "හේකිත්ත-මීගමුව" දක්වා කොටස පමණි. සෙසු කොටස ද ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාව අද මතු වෙමින් පවතී. දැනට කොළඹ වැල්ලවත්ත සිට නාවල විවෘත විශ්ව විද්‍යාලය දක්වා බෝට්ටු සේවාවක් පවත්වා ගෙන යයි.

| පසු වැඩ | ප්‍රතිචාර |
|---|---|
| **යෝජනාව :** ශ්‍රී ලංකාවේ පැරණි ඇළමාර්ග යළි ප්‍රතිසංස්කරණය කර ගත හොත්.............. | 1<br>2<br>3<br>4<br>5 |

## 8.3 ශ්‍රී ලංකාවේ සන්නිවේදනය

ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා ප්‍රවාහනයේ මැදිහත්කරු ලෙස සන්නිවේදන ජාල කටයුතු කරන අයුරු ඔබට විද්‍යාමාන වනු ඇත. රූපවාහිනී පුවත් ප්‍රචාරය, කෙටි නාට්‍ය විකාශය වන ගුවන් කාලය තුළ දී විකාශනය වන වෙළෙඳ දැන්වීම් සංඛ්‍යාව මීට සාක්ෂි දරනු ඇත. ශ්‍රී ලංකාවේ සන්නිවේදන ක්‍රියාවලිය ප්‍රධාන කොටස් කීපයක් යටතේ අධ්‍යයනය කළ හැකි ය.




**ශ්‍රී ලංකා සන්නිවේදන ගමන් මඟ ආශ්‍රිත වැදගත් තොරතුරු කීපයක් පහත දැක්වේ.**

- 1832දී "කළම්බු ජර්නල්" නමින් ඉංග්‍රීසි බසින් මුල් ම පුවත්පත බිහි විය.
- 1860දී විදුලි සංදේශ සේවය ආරම්භ විය.
- 1862දී "ලංකාලෝක" හා "ලක්මිණි පහන" පුවත්පත් සිංහල බසින් බිහි විය.
- 1864දී "උදයකාරකයි" නමින් දෙමළ බසින් පුවත්පතක් බිහි විය.
- 1925දී භාෂා තුනෙන් ම ගුවන් විදුලි විකාශය ඇරඹිණි.
- 1950 දශකයේ දේශීය චිත්‍රපටි කර්මාන්තය ඇරඹිණි.
- 1979 රූපවාහිනී සේවය ඇරඹිණි.
- 1982දී තැපැල් සේවාවට පෞද්ගලික අංශය ද එකතු විය.
- පෘථිවි චන්ද්‍රිකා මධ්‍යස්ථානයෙන් රාජ්‍ය ආයතන 107කට සේවා පහසුකම් සලසා දෙයි.

1995-2005 දශකයේ විද්‍යුත් මාධ්‍ය ජාලය සම්බන්ධයෙන් රාජ්‍යය හා පෞද්ගලික අංශවල ඇති වූ තරගය නිසා විශාල පෙරළියකට ලක් වී තිබේ.

තොරතුරු සොයමු..............විවාදයකට එක්වෙමු...............

- විද්‍යුත් සන්නිවේදනය ශ්‍රී ලංකාව වැනි රටකට හිතකර නොවේ./හිතකර වේ.
- සන්නිවේදනයේ දියුණුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට යොදා ගැනීම දුර්වල යි/ ප්‍රබල යි.

**ක්‍රියාකාරකම්**

1. "ශ්‍රී ලංකාවේ වෙළෙඳාම ප්‍රවාහනය හා සන්නිවේදනය මානුෂ ක්‍රියාකාරිත්වයේ මාධ්‍ය ලෙස කටයුතු කරයි". ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.
2. ශ්‍රී ලංකාවේ වෙළෙඳාම, ප්‍රවාහනය, හා සන්නිවේදනයේ නූතන ප්‍රවණතා ලැයිස්තුගත කරන්න.
3. ශ්‍රී ලංකාවේ වෙළෙඳාම, ප්‍රවාහනය හා සන්නිවේදනයේ දියුණුව නිසා මතු වී ඇති සමාජ සංස්කෘතික ගැටලු විස්තර කරන්න.

**ඔබේ දැනුම් පොතට** :---------

ශ්‍රී ලංකාවේ නළ මඟින් ප්‍රවාහනය කෙරෙන ජලය, ඉන්ධන, මළ අපද්‍රව්‍ය, ගෑස්, වැලි, ආදී ද්‍රව්‍ය පිළිබඳ පුවත්පත් හා කාලීන තොරතුරු ඇසුරින් කරුණු රැස්කර ගන්න.